# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2347/04 - 2023 අගෝස්තු මස 28 වැනි සඳුදා - 2023.08.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: DIVKB/LND/LA/AGRAQ/10.
ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය: 4-3/9/2019/A/192.

ගොවිජන සේවා මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 1318 - බොරළුවැව ග්‍රාම නිලධාරි වසමේ , වෙල්පිටිය ගමේ පිහිටි කුරුණෑගල මැනුම් අධිකාරි විසින් 2023.07.17 දින පිළියෙල කර ඇති කැඩැස්තර සිතියම් අංක 420716 හි, කලාප අංක 02, පත්‍ර අංක 01 හි ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6168 වන පහත විස්තර සඳහන් ඉඩම්.

01. **කැබලි අංක 1**
ඉඩමේ නම: වෙල්පිටිය වත්ත; ඉඩමේ විස්තරය: වත්ත; හිමිකම් කියන අය: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, ගොවිජන සේවා මධ්‍යස්ථානය පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වී ඇත; ප්‍රමාණය: හෙක්: 0.6168.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන්ගේ හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් 2023 නොවැම්බර් මස 29 වැනි දින පෙ.ව. 10.00 ට කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2023 නොවැම්බර් මස 22 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුය.

ඩබ්ලිව්. තිළිණි නිසංසලා සිල්වා,
ප්‍රාදේශීය ලේකම්,
කොබෙයිගනේ.

2023 අගෝස්තු මස 25 වැනි දින,
කොබෙයිගනේ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08-0273

1A - G 040211 – 14 (2023/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*